# පරාක්‍රමබාහු රජුගේ දෙවනගල ගිරි ලිපිය තුළින් හෙළිවන බුරුම ආක්‍රමණය

එන්. අයි. යූ. නවරත්න
විශේෂවේදී තෙවන වසර
ඉතිහාස අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය
iresha.udeshika@yahoo.com

**සංක්ෂේපය**

පොළොන්නරු යුගයේ දේශපාලනික ඉතිහාසය අධ්‍යයනයෙහිලා වැදගත් ශිලා ලේඛනමය මූලාශ්‍රයක් ලෙස දෙවනගල ලිපිය පිළිගැනේ. විශේෂයෙන් වංසකතා මූලාශ්‍රයන්හි එන තොරතුරු හා මෙකී ලේඛනයෙන් ඉදිරිපත්ව ඇති තොරතුරු අතර පවත්නා සමානත්වය හේතු කොට ගෙන දෙවනගල ගිරි ලිපියෙහි විශ්වාසනීයත්වය තව දුරටත් තීව්‍ර වී ඇත. මහා පරාක්‍රමබාහු රජු බුරුමයට එරෙහිව දියත් කළ සටන පිළිබඳවත් ඊට හේතු පාදක වූ කරුණු පිළිබඳවත් නගරගිරි සෙනෙවි උදෙසා ගම්වර ප්‍රදානය පිළිබඳවත් තොරතුරු දෙවනගල ගිරි ලිපියෙන් හෙළිවේ.

මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ පරාක්‍රමබාහු රජුගේ දෙවනගල ගිරි ලිපිය තුළින් හෙළිවන බුරුම ආක්‍රමණය මෙරටට වාසිදායක අයුරින් මෙන්ම රජුගේ හා රටේ අභිමානය රැකෙන අයුරින් නිමාවට පත් වූයේ කෙසේද යන්න විමසීමට ලක් කිරීමයි. මේ සඳහා ක්‍රමවේදය වශයෙන් යොදා ගනු ලැබූයේ ප්‍රාථමික හා ද්විතීක මූලාශ්‍රය අධ්‍යයනය කිරීමයි.

ලක් රජු හා සමාදානවන්නට බුරුම ජනතාවගෙන් බුරුම රජුට විශාල ඉල්ලීමක් තිබූ බව පෙනේ. බුරුම රජු ලංකාව සමඟ සමාදාන වන්නේ භික්ෂු සංඝයා හරහා ය. බුරුම රජු දෙරට අතර සමාදානය යලි ගොඩනගන ලෙස දූතයන් එවනු ලබන්නේ මෙරට සංඝයා වෙත ය. බුරුමය සමඟ නැවත සුපුරුදු මිත්‍රත්වයට පැමිණි පසු ලක් රජු වෙත අවුරුදු පතා බොහෝ ඇතුන් එවීමට ද, සිංහල දූතයන්ට හා වෙළඳුන්ට බුරුමය තුළ පැවති වරප්‍රසාද හා පහසුකම් එලෙසින්ම සලසා දීමට ද, බුරුම රජු එකඟත්වය පළ කෙරිණි. බුරුම සටන ලක්දිව රජුගේ යසස කීර්තිය වැඩි වන අන්දමින් හා මෙරටට වාසි සහගත අයුරින් නිමා වී ඇති බව කිවහැකිය.

**ප්‍රමුඛ පද :- දෙවනගල , බුරුමය , මහා පරාක්‍රමබාහු , ආක්‍රමණය , ගිරි ලිපිය**